මනාවට හැඩ ගැන්වෙන පනාගොඩ සනාතන ගීත

Photography/ ERANDA KUMARAPPERUMA

නීතියයි ගීතයයි එක්තැන් කල කවියෙකු, ප්‍රවීන ගීත රචකයකු, සමග මොහොතක්



අධිනීතිඥ
මෛත්‍රී පනාගොඩ

නිර්මාණ කලාවේ හා ඔබ ආ ගමනේ පාසල් කාලයේ සමකාලීන කලාකරුවන් ගැන යමක් කීවොත්?

කොළඹ ආනන්ද විද්‍යාලය සිංහල සාහිත්‍යයට කලාවට තෝතැන්නක් වූවා කීවොත් නිවරදියි. මගේ ජේෂ්ඨයන් තමයි ප්‍රේමකීර්ති ද අල්විස්, ඒ.ඩී.රංජිත් කුමාර, ඒ වගේම ඊට කලින් ඩී.බී.හිහාල්සිංහ, බණ්ඩාර සේ විජේතුංග වැනි ප්‍රවීනයන්.

සමකාලීනයන් හැටියට මගේ මතකයට එන්නෙ කුලරත්න ආරියවංශ, බන්දුල පද්මකුමාර, රෝහණ සිරිවර්ධන යන සහෘදයෝ. මේ හැම සඳහන් ගීතවත්තු ඒ ඒ මාධ්‍ය තුලින් ශ්‍රී ලංකාවේ ඉහලම තැන්වලට අද ඇවිත් තියෙනවා. මට හිතෙන්නෙ වැඩිපුරම මම කුළුපගව ඇසුරු කළේ රංජිත් කුමාර සහ කුලේ කියලා.

අපේ යාළුමිත්‍රකම් අදටත් ඒ විදිහටම පවතිනවා. අපි මාස දෙක තුනකට සැරයක් දුරකථනයෙන් කතාබහ කරනවා. මම ලංකාවට යන හැම විටකම නොවරදවාම මුණ ගැහෙන දෙන්නෙක් තමයි රංජිත් සහ කුලේ.

70 දශකයේ ප්‍රබුද්ධ ගී රචනයේ නිර්මාණ මූලිකත්වය ගත් එක් අයෙක් ඔබ. ඒ ගී තුලින් යම්කිසි ජනතා මෙහෙවරක් වූවාද යන්න ඔබේ අදහස?

ඒ කාලයේ තිබුන ජනතාවට ලංවූ එකම මාධ්‍යය වූ ගුවන් විදුලිය ගම් දනව් සිසාරා ප්‍රචාරය වුනේ පවුලේ සම්පිතම සන්නිවේදන මාධ්‍යයක් ආකාරයකට. ඉහලම පෙලේ සංගීතඥයන්, සහ ගායක ගායිකාවන් ගේ සහභාගීත්වය ලැබුන නිසා ඒ ගීත විශිෂ්ඨතම නිර්මාණ බවට පත්වුනා.

ඒ ගීත වලින් සනාථ වූ එක් දෙයක් තමයි ජනතාවගේ හදවතට කිව්වු වෙන්නේ ප්‍රේම ගීත විතරක් නොවයි කියන එක. මා හිතනවා බාල වැඩිහිටි කවුරුත් ප්‍රබුද්ධ ගීත බොහොම ආදරයෙන්, ආඩම්බරයෙන්, උද්දාමයකින් වැළඳගත්තාය කියලා. ඒ ගීත වලින් එක්තරා විදිහක පිබිදීමක් ඇතිවුනා. අද 50-60 වයස මට්ටම්වල ඉන්නා බොහෝ දෙනෙක් කියනා දෙයක් තමයි ඒ අ ය පාසල් යන ගමන් මුමුණ මුමුණ ගියේ ප්‍රබුද්ධ ගීත කියලා.

ඒ කියන්නේ කිසියම් ජාති මාමකත්වයක්, රට ගැන මහපොළව ගැන ආඩම්බරයක් සහ අවිදිවීමක් ප්‍රබුද්ධ ගීත වලින් සිදුවුනා කියන එක අවිවාදයෙන් පිළිගත යුතු දෙයක්. අනෙක් වැදගත් ම වූ දේ තමයි මේ ගායක ගායිකාවෝ හැම ආස්වාද තලයකටම සුදුසු වුනා. පණ්ඩිත් අමරදේවයන්, නන්දා මාලිනී, වික්ටර් රත්නායක, සනත් නන්දසිරි වගේම එච්.ආර්.ජෝතිපාල පවා මේ මෙහෙවරට දායක වුනා.

Maithri Panagoda | Official Website
maithripanagoda.com

"පාවි පාවි මේ එන්නේ අතීතයේ සිට එන සුළඟයි" ජන සම්මානයට පාත්‍ර වූ මේ ගීතය සදාකාලික පැවැත්මක් ඇති ගීතයක් ලෙස බොහෝ දෙනාගේ අදහසයි. ගීතයක කාල සීමාව එහෙම නැත්නම් එහි පැවැත්ම ගැන ඔබ සිතන්නේ කුමන ආකාරයෙන්ද?

ගීත සාහිත්‍යය නිරන්තරයෙන් පෝෂණයවෙන කලාවක්. දිනපතාම අලුත් ගී නිර්මාණය වෙනවා. නමුත් සදාකාලික වටිනාකමක් තියෙන ගීත මා හිතන විදිහට ප්‍රතිශතයක් වශයෙන් කියනවානම් සියයට දහයක් විතරයි ඇත්තේ. මෙය ලෝකයේ අනෙකුත් රට වලටත්, භාෂා වලටත් උරුමවෙන සත්‍යයක්.

නොයෙකුත් සම්භාෂණ ඒවගේ ම "පැදුරු පාවි" වලට සහභාගී වනවිට පෙනෙන දෙයක් තමයි අදත් වැඩිම ඉල්ලීමක් තියෙන්නෙ 70 දශකයේ නිර්මාණය වුන ගීත වලට බව. ඒ කාලයේ ජීවත් වුන අද වැඩිහිටියන්ව ඉන්නා අය විතරක් නොවෙයි වයස විසි තිස් ගණන්වල ඉන්නා තරුණ තරුණියන් පවා ඒ පැරණි ගී නිර්මාණවලට පුදුම ලැදිකමක් දක්වනවා.

මැතකදී ඔබ "සුදු වැලි" නම් වූ සංගත තැටිය එළිදැක්වුවා. ඔබ රචනා කල බොහොමයක් ගී එහි අඩංගු වුනා පමණක් නොවේ එදා ජනප්‍රිය ගී ගොන්නක් රසිකයින් වැළඳගත්තා. නිර්මාණයන්ට දායකවූ සුප්‍රකට සංගීතඥයින් ගායක ගායිකාවන් හා ඒ ගී ගැන පැහැදිලි කළොත්?

පාසල් යන කාලයේ දී මම "ළමා පිටිය" යොවන සමාජය වැනි ගුවන් විදුලි වැඩ සටහන්වලට සහභාගී වුනා. විශාරද දයාරත්න රණතුංගයන් මෙහෙය වූ ළමා වැඩ සටහන් වලටයි මම මුලින් ම ගීත රචනා කළේ. මා ලියූ මුල් ම ප්‍රබුද්ධ ගීත වලට ප්‍රේමසිරි කේමදාසයන් ගේ තනු සහ සංගීත දායකත්වය ලැබීම "පෙර පිනක්" හැටියට හැඳින්වුවොත් වරදක් නැහැ. ආධුනික රචකයෙකුට කේමදාසයන් වැනි අග්‍රගණ්‍ය සංගීතඥයකුගේ අනුග්‍රහය හා දිරිගැන්වීම ලැබීම එසේ මෙසේ භාග්‍යයක් නොවෙයි.

මමත්, ටී.එම්.ජයරත්න, නිලා වික්‍රමසිංහ වැනි ඒ කාලයේ ආධුනික ගායක ගායිකාවනුත්, ගාමිණී විජේතුංග, අජන්තා රණසිංහ වැනියනුත් ඒ කාලයේ කේමදාසයන්ව ළඟින් ආශ්‍රය කළා කියන්න පුළුවන්. අපි රාජගිරියේ ඔහුගේ නිවසට එකතුවෙලා නොයෙකුත් විෂයන් ගැන සාකච්ඡා කරනවා. මම තමයි "පොඩි එකා" මම වැඩිය කතාකරන්නෙ නැහැ. අහගෙන ඉන්නවා. මාතින් පසුව ලියැවුන ගීත වලට දයාරත්න රණතුංග,ලයනල් අල්ගම,ජස්ටින් ගාල්ලගේ වැනි ප්‍රතිභාපූර්ණ සංගීතඥයින් ගේ සහභාගීත්වය ලැබුනා.

ගී රචනා කවි කතා නිර්මාණයේ දී යම් කිසි අත්දැකීම් සිදුවීම් පාදක කරගත් අවස්ථා තිබෙනවාද?

අපි කොයි ආකාරයෙන් බැලුවත්, ඕනෑම කලා නිර්මාණයකට කිසියම් අත්දැකීමක් හේතු සාධක වෙලා තියෙනවා. එය තමන්ගේ පෞද්ගලික අනුභූතියක් ම විය යුතු නැහැ. මා හිතනවා කලාකරුවකු ගේ හැසියාව පිළිබිඹු වෙන්නෙ කාගේ හෝ අත්දැකීමක් තමන්ගේ ම ජීවිතයේ කොටසක් හැටියට පිළි ආරගෙන ඒ තුලින් නිර්මාණයක් කිරීමෙනුයි.

බොහෝ දෙනා ප්‍රේමය දකිනා ආකාරයට වඩා නිර්මාණීය රචකයා එය සෞන්දර්යාත්මක ව වැළඳගන්නවා පමණක් නොවේ රසිකයිනට සංවේදී අයුරින් ඉදිරිපත් කරනවා. මෙතැන දී ඔබේ අදහස?

මා කරන රැකියාවේ හැටියට මට එදිනෙදා ජීවිතයේ දී නොයෙකුත් තරාතිරමේ අය හමුවෙනවා. ඒ හැම කෙනෙක් තුලම "කතාන්දරයක්" තියෙනවා. සංවේගී,විනෝද ජනක,ප්‍රේමණීය,අද්භූත,චමත්කාර මේ ආදී නොයෙකුත් අත්දැකීම්. මේවා සිත තුල තැන්පත් සිදුවීම් වෙන්නට පුළුවන්. නිර්මාණයක් කෙරෙන විට ඒ මතකයන් මතුවෙනවා මතු පිටට. මා හිතනා විදිහට නිර්මාණ රචකයා තුල සංවේදිතාවක් තිබිය යුතුයි.

ප්‍රවෘත්ති ප්‍රකාශකයා ගේ යුතුකම කිසියම් සිද්ධියක් සිදුවූ විදිහට ම වාර්තා කිරීමයි. නමුත් නිර්මාණ ශිල්පියා ඒ සිදුවීම විනිවිද දකිමින් චින්තනය තුලින් කලාත්මක නිර්මාණ කල යුතුයි. "ඇති දේ ඇති සැටියෙන් කීම කාව්‍යය නොවේ" කියලා කියමනක් තියෙනවා. කලාකරුවාගේ වගකීම සිදුවීමක් හෝ අත්දැකීමක් කලාත්මකව සංවේදීව ඉදිරිපත් කරීමයි. " ඉර බඟින වෙලාවේ " කියනවාට වඩා නිර්මාණශීලි බවක් තියෙනවා "සෙවනැලි මිය යන හැන්දෑවේ" කිව්වාම. "මිට පසු මට ප්‍රේම කරන්න එපා"කියනවාට වඩා අලංකාරයි "මා ගැන මතකය ගුලිකර මහවැලියට දමන්න" කීවාම.